# 2010 වර්ෂය සඳහා මැතිවරණ කොමසාරිස්වරයාගේ පාලන වාර්තාව

මහින්ද දේශප්‍රිය
2011 ජූනි

# தேர்தல்கள் ஆணையாளரின் 2010 ஆம் ஆண்டிற்கான நிருவாக அறிக்கை

**மஹிந்த தேசப்பிரிய**
**யூன்** 2011

# ADMINISTRATION REPORT OF THE COMMISSIONER OF ELECTIONS FOR THE YEAR 2010

**Mahinda Deshapriya**
**June 2011**

## 2010 වර්ෂයේ මැතිවරණ කොමසාරිස්වරයාගේ පාලන වාර්තාව

2010 වර්ෂය වෙනුවෙන් ඡන්ද හිමියන් ගණන් ගැනීම, 2009 වර්ෂය සඳහා ප්‍රතිශෝධනය කරන ලද ඡන්ද හිමි නාමලේඛනය සහතික කිරීම, ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා ඡන්ද විමසීම පැවැත්වීම, පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීම, පාර්ලිමේන්තුවේ සහ පළාත් සභාවල මන්ත්‍රී ධූර, පළාත් පාලන ආයතනයන්හි සභික ධූර පුරප්පාඩු පිරවීම සහ දේශපාලන පක්ෂ පිළිගැනීම සඳහා වූ ඉල්ලීම් පිළිබඳව කටයුතු කිරීම යන කාර්යයන් මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් 2010 වර්ෂයේ දී ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන් වේ.

02. 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත:

2.1. ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2009

**2.1.1.** 2009 වර්ෂය වෙනුවෙන් ඡන්ද හිමියන් ගණන් ගැනීම 2009.06.01 වන දින අරඹන ලදි. එම වර්ෂය වෙනුවෙන් ඡන්ද හිමි නාමලේඛනයට නම් ඇතුළත් කර ගැනීමට සුදුසුකම් ඇති අය කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 12 (1) වගන්තිය යටතේ වූ දැන්වීම 2009.06.01 දින අංක 1604/21 දරන රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලදි. ඊට අමතරව එදිනම එම දැන්වීම සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් පුවත්වල පළ කිරීමට කටයුතු කරන ලදි.

**2.1.2.** වාර්ෂික ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළ දිස්ත්‍රික් ලියාපදිංචි කිරීමේ නිලධාරීන් විසින් පත්කරනු ලබන ගණන් ගැනීමේ නිලධාරීන්ගේ ගෙන් ගෙට ගොස් ඡන්දහිමියන් ගණන් ගැනීමේ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා පක්ෂ නියෝජිතයින් පත්කිරීමට ඇති හැකියාව පිළිබඳව සහ ඊට අදාළව දේශපාලන පක්ෂ ලේකම්වරුන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව එම ලේකම්වරුන් 2009.05.04 දින ලිපියක් මාර්ගයෙන් දැනුවත් කිරීමට කටයුතු කරන ලදි.

**2.1.3.** ඡන්ද හිමියන් ගණන් ගන්නා නිලධාරීන් විසින් එම කටයුතු අවසන් කිරීමෙන් පසුව පිළියෙල කරනු ලබන 'අ' ලැයිස්තුව සහ 'ආ' ලැයිස්තුව ප්‍රවර්ථන නාමලේඛනය සමග 2010.01.01 දින සිට 2010.01.29 දින දක්වා මහජනයා වෙනුවෙන් ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන ලද අතර එම කාලය තුළ 2009 වර්ෂය වෙනුවෙන් හිමිකම් සහ විරෝධතා ඉදිරිපත් කිරීමට ද ඉඩකඩ ලබාදෙන ලදි. මෙම ලේඛන ප්‍රදර්ශනය කිරීම සම්බන්ධව ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 13(2) යටතේ වූ දැන්වීම 2010.01.01 දිනැති 1634/29 අංක දරන ගැසට් පත්‍රයේ සහ එදිනම පුවත්පත්වල පළ කිරීමට කටයුතු කරන ලදි.

**2.1.4.** අදාළ කාලය තුළ එක් එක් මැතිවරණ කොට්ඨාසය යටතේ දිස්ත්‍රික් ලියාපදිංචි කිරීමේ නිලධාරීන් වෙත ලැබුණ හිමිකම් ඉල්ලීම් සහ විරෝධතා දැක්වීම් සංඛ්‍යාව පිළිබඳ විස්තර අංක I දරණ සටහනේ දැක්වේ. මැතිවරණ කොට්ඨාස සියල්ල වෙනුවෙන් හිමිකම් ඉල්ලීම් 75,769 ක් හා විරෝධතා දැක්වීම් 376 ක් ලැබී තිබිණි.

**2.1.5.** 2009 වර්ෂයේ මැද භාගය වනවිට උතුරු හා නැගෙනහිර පළාත්වල වසර තිහකට ආසන්න කාලයක් පැවති ත්‍රස්තවාදී ක්‍රියා මැඩලීම සඳහා රජයේ ආරක්ෂක හමුදා විසින් ක්‍රියාත්මක කරන ලද යුධමය කටයුතු ඉතා තීව්‍ර මට්ටමකට පත්වී තිබිණි. ඒ අවස්ථාව වන විට එම ත්‍රස්තවාදී මර්ධන කටයුතු වෙනුවෙන් ආරක්ෂක හමුදා වල යුධමය කටයුතු බොහෝ දුරට වවුනියා, මන්නාරම, මුලතිව් හා කිලිනොච්චිය යන පරිපාලන දිස්ත්‍රික්ක වලට සීමා වී තිබුනි. මෙම යුධමය කටයුතු වවුනියාව හා මන්නාරම යන දිස්ත්‍රික්කවල යම් යම් ප්‍රදේශවලට සීමා වුවද මුලතිව් හා කිලිනොච්චි යන දිස්ත්‍රික්කවල මුළු භූමි ප්‍රදේශවලම පැතිරී තිබුණි. එබැවින් එම දිස්ත්‍රික්කවල ත්‍රස්වාදීන්ගේ ග්‍රහණය යටතේ පැවති ප්‍රදේශ කොටස් වශයෙන් විටින් විට රජයේ හමුදා විසින් මුදා ගන්නා අවස්ථාවල, එවැනි ප්‍රදේශවල පදිංචිව සිටි සිවිල් ජනතාවට ආරක්ෂිතව සිටීම සඳහා රජය විසින් වවුනියාව දිස්ත්‍රික්කය තුළ සුභ සාධන මධ්‍යස්ථාන විශාල සංඛ්‍යාවක් පිහිටුවන ලදි.

**2.1.6.** ඉහත ප්‍රදේශ හැරුණු කොට යාපනය මැතිවරණ කොට්ඨාසයේ කන්කසන්තුරේ, කෝපායි හා පේදුරුතුඩුව යන ජන්ද ප්‍රදේශවල ත්‍රස්තවාදීන් විසින් යොදා තිබූ බිම් බෝම්බ හේතුවෙන් අනාරක්ෂිතව පැවැති ප්‍රදේශවල සහ රජයේ ආරක්ෂක අංශ විසින් පිහිටුවා තිබූ අධි ආරක්ෂිත කළාප හේතුවෙන් එම ජන්ද ප්‍රදේශ තුනෙහි යම් යම් ප්‍රදේශවල සාමාන්‍ය ජනතාව පදිංචියෙන් ඉවත් කොට තිබුණි.

**2.1.7.** ඉහත හේතූන් මත ඉහත සඳහන් ප්‍රදේශවලට නැවත මහජනයා පදිංචි කිරීම 2009 වර්ෂය තුළ සිදුකොට අවසන් නොවන බව පෙනී ගිය බැවින්, එම ප්‍රදේශවල 2008 වර්ෂයේ ලියාපදිංචි වී සිටි පුද්ගලයින්ගේ නම් ඒ ආකාරයෙන්ම එම ප්‍රදේශ යටතේ 2009 වර්ෂය වෙනුවෙන් ද ලියාපදිංචි කිරීමට කටයුතු කරන ලදි. මේ අන්දමින් ජන්ද හිමියන් ගෙන් ගෙට ගොස් ගණන් ගැනීමකින් තොරව ජන්ද හිමියන් ලියාපදිංචි කරන ලද ජන්ද කොට්ඨාස පිළිබඳ විස්තර අංක II දරන සටහනේ දක්වා ඇත.

**2.1.8.** බහු ලියාපදිංචියට අදාළ පුද්ගලයින්ගේ නම සම්බන්ධව ක්‍රියාකළ යුතු ආකාරය1980 අංක 44 දරන ජන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 12(7) වන වගන්තියෙහි දැක්වේ. 2009 වසර වන විට ජන්ද හිමි නාමලේඛනය සකස් කිරීම සඳහා දිවයිනේ සෑම මැතිවරණ කොට්ඨාසයක් වෙනුවෙන්ම භාවිතා කරන ලද පරිගණක මෘදුකාංගය අනුව එක සමාන ජාතික හැඳුනුම්පත් අංක සමග එක් ලිපිනයකට වැඩි ලිපිනයන් සංඛ්‍යාවක් යටතේ පුද්ගලයකු එක් මැතිවරණ කොට්ඨාසයක ලියාපදිංචියට ඉල්ලා ඇත්නම් ඒ පිළිබඳව සොයා බැලීමට අවශ්‍ය වාර්තා ලබා ගත හැකිවේ.

**2.1.9.** ඉහත සඳහන් ආකාරයට බහු ලියාපදිංචියට හේතු වූ පුද්ගලයින් පිළිබඳ තොරතුරු හෙළි වූ විට ඔවුන් වෙත, සුදුසුකම ඇති එක් ලිපිනයක් යටතේ ලියාපදිංචි වීමේ ඇති අවශ්‍යතාවය දිස්ත්‍රික් ලියාපදිංචි කිරීමේ නිලධාරීන් විසින් දන්වා එබඳු පුද්ගලයින් එක් ලිපිනයක් යටතේ පමණක් ලියාපදිංචි කිරීමට කටයුතු කරන ලදි. මෙසේ බහු ලියාපදිංචියට අදාළ වූ නම් 37,246 ක් 2009 වර්ෂයේ දී ඡන්ද හිමි නාමලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරන ලද අතර ඉන් නම් 15,251 ක් ම අයත් වී තිබුනේ කොළඹ මැතිවරණ කොට්ඨාසයටය. මේ පිළිබඳ විස්තර අංක III දරන සටහනේ දක්වා ඇත.

**2.1.10.** 2009 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛනය, ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 18 වන වගන්තිය යටතේ 2010.05.31 වන දින සහතික කරන ලදි. ඒ බව එම පනතේ 20 වන වගන්තිය යටතේ අංක. 1656/18 දරන 2010.05.31 දිනැති ගැසට් පත්‍රයේ සහ පුවත්පත් වල දැන්වීම් මගින් ප්‍රසිද්ධ කරන ලදි.

**2.1.11.** 2009 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛනය සහතික කිරීමෙන් පසු ඒ ඒ මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධාරියා විසින් ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 23 වන වගන්තිය අනුව නාමලේඛනයේ දැක්වෙන මුළු නම් සංඛ්‍යාව පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ ප්‍රකාශ පදනම් කරගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) අනු ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තු මැතිවරණයක දී එක් එක් මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් තෝරා පත් කර ගත යුතු මන්ත්‍රී සංඛ්‍යාව පිළිබඳ මැතිවරණ කොමසාරිස්වරයාගේ නියමය අංක. 1674/5 දරන 2010.10.05 දිනැති ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු කරන ලදි.

## 2.2. ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2010

**2.2.1.** 2010 වර්ෂයේ ඡන්ද හිමියන් ගණන් ගැනීම ආරම්භ කිරීම සම්බන්ධයෙන් ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 12(1) යන වගන්තිය යටතේ වූ දැන්වීම 2010.06.01 වන දිනැති අංක. 1656/20 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලදි.

**2.2.2.** සියලුම මැතිවරණ කොට්ඨාසවල ඡන්ද හිමියන් ගණන් ගැනීම සම්බන්ධව ගතයුතු පියවර පිළිබඳව දිස්ත්‍රික් ලියාපදිංචි කිරීමේ නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් නිකුත් කරන ලද අතර ප්‍රතිශෝධනය සම්බන්ධව සහ ඊට අදාළ දේශපාලන පක්ෂ නියෝජිතයින් පත්කළ යුතු ආකාරය පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2010.04.20 වන දින පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන් දැනුවත් කිරීමට කටයුතු කරන ලදි.

**2.2.3.** 2009 වර්ෂයේ අග භාගයේ දී උතුරු පළාතේ පැවති යුධමය වාතාවරණයෙන් පසු තාවකාලිකව සුභ සාධන කඳවුරු වල පදිංචිව සිටි පවුල් ඔවුන්ගේ මුල් පදිංචි ස්ථානවලට ආරක්ෂා සහිතව පදිංචි කිරීම සඳහා යැවීමට රජය කටයුතු කරමින් සිටින ලදි. විශේෂයෙන් විවිධ රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානවල ආධාර ඇතිව යුධ ගැටුම් පැවති ප්‍රදේශවල බිම් බෝම්බ ඉවත් කිරීම සිදුකළ අතර එම කටයුතු අවසන් වූ පසු එම ප්‍රදේශවල ආරක්ෂිත භාවය තහවුරු වීමෙන් අනතුරුව ආරක්ෂක අංශවල උපදෙස් පරිදි එම ප්‍රදේශවල දිසාපතිවරුන් විසින් පුද්ගලයින් නැවත පදිංචි කිරීම සිදු කරන ලදි. මෙම කටයුතු ඉක්මනින් සිදු කළ නොහැකි කාර්යයක් වූ බැවින් වවුනියාව, යාපනය, මුලතිව් සහ කිලිනොච්චි යන දිස්ත්‍රික්කවල පුද්ගලයින්ගේ නැවත පදිංචි කිරීමේ කටයුතු වල ප්‍රගතිය සොයා බලමින් එසේ නැවත පදිංචි කරන ලද පුද්ගලයින් ලියාපදිංචි කිරීමට අවශ්‍ය පියවර ගැනීමට සිදුවිය. මේ සඳහා එම දිස්ත්‍රික්කවල ලියාපදිංචි කිරීමේ නිලධාරීන්ට විශේෂ උපදෙස් නිකුත් කිරීමට මැතිවරණ කොමසාරිස්වරයා විසින් පියවර ගන්නා ලදි.

**2.2.4.** උතුරු පළාතේ ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීම සඳහා ගන්නා ලද පියවර

2.2.4.1. දීර්ඝ කාලයක් ත්‍රස්තවාදී ක්‍රියා නිසා සිවිල් පරිපාලන කටයුතු අඩාල වූ ප්‍රදේශවල ඡන්ද හිමියන් ගණන් ගැනීම නියමාකාරයෙන් වාර්ෂිකව සිදු කිරීමට නො හැකි වූ නිසා ප්‍රධාන වශයෙන් උතුරු ප්‍රදේශයේ නාමලේඛනවල පහත සඳහන් අඩුපාඩු දන්නට ලැබුනි.

- අවතැන් වූ ඡන්ද හිමියන්ගේ නම් ඔවුන් අවතැන් වීමට පෙර පදිංචි වූ ස්ථාන යටතේ සංශෝධනයකින් තොරව ලියාපදිංචි කිරීමට සිදුවීම
- සෑම වසරකම සති හතරක කාලයක් නොවැම්බර් හෝ දෙසැම්බර් වැනි මාසවල සුදුසුකම් ලබන පුද්ගලයින්ට හිමිකම් ඉදිරිපත් කිරීම සඳහා මෙන්ම ලියාපදිංචියට නුසුදුසු නම් ඉවත් කිරීම සඳහා විරෝධතා දැක්වීමට අවකාශයක් දී තිබුණ ද උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල අවතැන් වූ පවුල්වලට බොහෝ විට මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගෙන ඉල්ලීම් ඉදිරිපත් කිරීමට හැකියාවක් නො ලැබීම
- ගෙන් ගෙට ගොස් ඡන්ද හිමියන් ගණන් ගැනීමට අවකාශයක් නො ලැබීම නිසා විදේශවලට පදිංචිය සඳහා ගිය පුද්ගලයින්ගේ නම් මෙන්ම මියගිය පුද්ගලයින්ගේ නම් ද නාමලේඛනවලට ඇතුළත්ව තිබීම.